පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය - 2014
-----------------------------------------------------------------------------------------

පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 මැයි 08 දින එළඹි අංක 2892 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ 2.09 ඒ (ii) ව්‍යවස්ථාව සහ ප්‍රදාන අංක 0303-එස්ආර්අයි (ඊඑෆ්) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (I) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව, විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ලංකා විදුලිබල මණ්ඩලය (CEB) ව්‍යාපෘතියේ සියළුම කොටස් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SEA) 07 වැනි කොටස ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පිවිතුරු විදුලිබල සැපයුම වැඩිකිරීම සහ ශ්‍රී ලංකාවේ විදුලි බලය බෙදාහැරීමේ කාර්යක්ෂමතාවය හා විශ්වාසය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 200 ක් හෙවත් රු. මිලියන 25,240 ක් වන අතර එයින් එජඩො මිලියන 131.5කට සමාන රු.මිලියන 16,595 ක් හෙවත් සියයට 66ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 සැප්තැම්බර් 30 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට නියමිතය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම්

තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාල පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් , ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය/ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය/ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය/ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය/ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරැදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා  ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරැදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූයේද යන බව.

**1.5 මතය සඳහා පදනම**

----------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2 මූල්‍ය ප්‍රකාශන**

--------------

**2.1 මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණය කිරීම සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමණාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඉ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හෝමාගම සහ අඹගමුව කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පාදුක්ක හා පොල්පිටියේ ග්‍රිඩ් විදුලි උපපොලවල් ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් දෙකක් අත්පත් කර ගැනීමට ලබාදෙන ලද රු.මිලියන 25.44 ක තැන්පතුව කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුවේ වියපැහැදම් රු.මිලියන 388.30 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 212.73 ක් ලෙස පෙන්වා තිබුණි. මෙම වෙනස පිළිබඳව විගණනයට පැහැදිලි නොකරන ලදී.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිනුම් පිරිවැය වූ රු.මිලියන 3.29 ක් ඉඩම් යටතේ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට විවිධ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

2015 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කළ යුතු ව්‍යාපෘතියේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන, විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2015 ජුනි 18 දිනදීය.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

3.1 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය දක්වා අරමුදල් උපයෝජනය සහ 2014 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය සම්බන්ධයෙන් වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන/ණය ගිවිසුම් අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| ඒ.ඩී.බී. | 131.5 | 16,595.3 | 2,750.0 | 1.6 | 213.0 | 1.6 | 213.0 |
| ජී.ඕ.එස්.එල්. | 68.5 | 8,644.7 | - | - | - | - | - |
| සී.ඊ.බී. | - | - | 959.0 | 1.6 | 210.0 | 2.0 | 269.0 |
| එකතුව | 200.0 | 25,240.0 | 3,709.0 | 3.2 | 423.0 | 3.6 | 482.0 |

2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාලය සියයට 50 ක් ඉක්මවා තිබුණද ණය හා ප්‍රදාන වෙන්කිරීම් වලින් සියයට 1.2 ක් පමණක් යොදාගෙන තිබුණි. එබැවින් ඉතිරි කාලපරිච්ඡේදය තුළදී මුළු ඇස්තමේන්තුගත ණය හා ප්‍රදානය උපයෝජනය කිරීමේ හැකියාව පිළිබඳ විගණනයේදී ගැටළු සහගත විය.

## 3.2 භෞතික ප්‍රගතිය

-----------------

ලංකා විදුලිබල මණ්ඩලය විසින් කොටස් 06 ක් යටතේ එහි අරමුණු වන සම්පූර්ණ යටිතල පහසුකම් බෙදාහැරීම ශක්තිමත් කිරීම හා ජාල කාර්යක්ෂමතාවය හා බෙදාහැරීම වැඩිදියුණු කිරීම උදෙසා ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. එනිසා මන්නාරම, පොල්පිටිය, පාදුක්ක, සහ කැගල්ලේ ග්‍රීඩ් විදුලි උපපොළවල් ඉදිකිරීම සහ සවිකිරීම් සහ බියගම, කොලොන්නාව සහ සපුගස්කන්ද බැංකුවල බ්රේක ස්විච් කැපසිටර්ස් (breaker switch capacitors) සවිකිරීම සහ කැබිතිගොල්ලෑව, කහටගස්දිගිලිය, ගලහ සහ අක්කරපත්තුව කුලුනු ඉදිකිරීම හා සවිකිරීම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වෙතත් සියළුම කොටස්වල ප්‍රධාන කාර්යයන් සමාලෝචිත වර්ෂය තුලදී ආරම්භ කර නොතිබුණි.

ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ පළමු කොටසේ ලොට් ඒ යටතේ මන්නාරම් ග්‍රීඩ් විදුලි උපපොළවල් ඉඩම් මැනුම් කාර්යය සහ එම කොටසේම ලොට් බී යටතේ සම්ප්‍රේෂණ මාර්ග මිනුම්කරණය වර්ෂ 1 ½ ක ප්‍රමාදයකින් පසුව 2015 මාර්තු මස ආරම්භ කර තිබුණි.

(ආ) ඉඩම් අත්පත් කරගැනීමේ හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය නිසා ව්‍යාපෘතියේ දෙවැනි කොටස යටතේ වූ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල කාර්යයක්ෂමතාව වැඩිදියුණු කිරීමට අදාල සියළුම කාර්යයන්හි මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ 3 වන කොටස යටතේ වූ පාදුක්ක විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධනය සහ 4 වන කොටස යටතේ වූ කැගල්ල විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන කටයුතු මූලික අදියරේ එනම් ඉදිකිරීම් වැඩ හා සම්ප්‍රේෂණ කටයුතු සඳහා ඉඩම් මිනුම්කරමින් පැවතුනි.

## 3.3 මූල්‍ය පාලන දුර්වලතා

----------------------

ව්‍යාපෘතියේ සෘජු වගකීම ලංකා විදුලි බල මණ්ඩලය වෙත තනි ඒකකයක් ලෙස මුළුමනින්ම පවරා නොතිබුණු බැවින් කාලානුරූපීව මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇගැයීම් හා සුදුසු නියාමක ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් කාලසීමාව ඇතුළත ලංකා විදුලි බල මණ්ඩලය සහතික වී නොතිබුණි.